මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :LAE/2025/83 | 2025.05.01

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## ආබාධ සහිත ඡන්දහිමියන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අන්තර්කරණය කිරීම සඳහා පහසුකම් සැලසීම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ක්‍රියාවලිය තුළ කිසිදු අපහසුතාවයකින් තොරව ආබාධ සහිත ඡන්දහිමින්ට ඡන්දය සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් (Reasonable Accommodations) සහතික කිරීමේ අරමුණින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පහත පරිදි පහසුකම් තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ.

02. ඡන්ද විමසීමේ දී ඡන්ද පත්‍රිකාව වලංගු ලෙස සලකුණු කිරීමට නොහැකි අන්දමේ පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයක් හෝ ශාරීරික අශක්නුතාවකට පත් ඡන්දහිමියෙකුට එම ඡන්දහිමියා විසින් නියම කරනු ලබන පරිදි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සහ ඔහුගේ කාර්යය මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී සහායකයකු ලවා ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට යම් තැනැත්තකු කැටුව යා හැකි අතර එම ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ඉඩකඩ සැලැස්වීම සඳහා 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධි විධාන) පනත මගින් නෛතික ප්‍රතිපාදන අනුව පහසුකම් සලසා ඇත.

03. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අවස්ථාවක යම් ශාරීරික දුර්වලතාවක් (චලනාබාධිත තත්ත්වයක්) නිසා ඡන්දය විමසන ස්ථානයකට පයින් හෝ යම් මහජන ප්‍රවාහන සේවයකින් හෝ යාමට ඡන්දහිමියෙකුට නොහැකි වන අවස්ථාවක, ඒ වෙනුවෙන් යම් වාහනයක් පාවිච්චි කිරීමට ලිඛිත බලයක් තේරීම්භාර නිලධාරීයාගෙන් ඉල්ලුම් කොට ලබා ගැනිමට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 82 උ (4) (ඈ) වැනි උප වගන්තිය ප්‍රකාරව පහසුකම සලසා ඇත.

04. ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවන ස්ථානයේ සිට ඡන්ද විමසීම පවත්වන ශාලාව වෙත මීටර් 100 හෝ ඊට වැඩි දුරක් පයින් ගමන් කිරීමට සිදුවන අවස්ථාවල දී යම්කිසි කායික ආබාධයක් / ඇවිදීමේ අපහසුතාවයක් නිසා පයින් යාම ඊම් කළ නොහැකි තැනැත්තෙකුට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි භූමියේ ප්‍රධාන පිවිසුම් දොරටුවේ සිට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල දක්වා ත්‍රිරෝද රථ මඟින් නොමිලේ ප්‍රවාහන පහසුකම් සලසා ඇත.

05. පූර්ණ හෝ අර්ධ දෘශ්‍යාබාධ සහිත ඡන්දහිමියන්ට තනිවම ඡන්දය සලකුණු කිරීම සඳහා "ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්පර්ශක රාමුව (Tactile Stencil Frame)" සෑම ඡන්ද මධ්‍යස්ථානයක ම භාවිත කිරීමට පහසුකම් සලසා ඇත. ස්පර්ශක රාමුව භාවිතා කරමින් ඡන්දය සලකුණු කරන දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට කිසිදු බාධාවකින් තොරව ඡන්දය සලකුණු කිරීමට අවශ්‍ය පහසුකම් සහ සහාය ලබාදීමට ක්‍රියා කරන ලෙස ඡන්ද පොළ කාර්යය මණ්ඩලය දැනුම්වත් කර ඇත.

06. මැතිවරණ කොමිෂන් සභාව විසින් පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත, ඡන්දය පාවිච්චි කිරීමේ දී අනන්‍යතාවය සනාථ කිරීමේ දී වලංගු අනන්‍යතා ලේඛනයක් (වලංගු හැඳුනුම්පතක්) ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති බැවින් එය ඡන්ද පොළේ දී ඉදිරිපත් කරන ඡන්ද දායකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවකාශය ලබාදී ඇත.

07. ශ්‍රවණාබාධ සහිත ඡන්දදායකයින්ගේ දැනගැනීමේ පහසුව සඳහා ඡන්ද පොළ පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් (වලංගු අනන්‍යතා ලේඛන සහ ඡන්ද පොළ පරිශ්‍රයේ තහනම් දෑ) සංඥා භාෂාවෙන් රූපසටහන් සහිතව සකස් කර සෑම ඡන්ද පොළක ම, දැන්වීම් ප්‍රදර්ශනය කර ඇත.

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl

08. මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරඟ කරන එක් එක් පළාත් පාලන ආයතනවල පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයින්ගේ විස්තර භාෂා ත්‍රිත්වයෙන්, මැතිවරණ කොමිෂන් සභාවේ ඊ-සේවා හරහා ලබාගැනීමේ පහසුකම සලසා ඇති අතර එය යුනිකෝඩ් අකුරු (Unicode fonts) වලින් යුක්ත වන නිසා තිර කියවීමේ (Screen Reader) පහසුකම් සහිත ජංගම දුරකථන හෝ පරිගණක තිර හරහා දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට ශ්‍රවණය කළ හැකි ආකාරයෙන් පහසුකම් සලසා ඇත. (https://eservices.elections.gov.lk යොමුව හරහා මැතිවරණ කොමිෂන් සභාවේ ඉ-සේවා වෙත පිවිස එහි "පුරවැසියා සඳහා" වන යොමුවෙන් "මැතිවරණය සඳහා ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු" ඉ සේවාව වෙත පිවිස ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් පසු "KYC" යොමුව මඟින් අදාළ පළාත් පාලන ආයතනය වෙනුවෙන් තරඟවදින අපේක්ෂකයින්ගේ තොරතුරු ඉතා පහසුවෙන් දැනගත හැකි ය. මේ පිළිබඳ QR කේතයක් හඳුන්වා දී ඇති අතර එය මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත).

09. ඡන්ද පොළ තුළ ආබාධ සහිත ඡන්දහිමියන්ට අවශ්‍ය අමතර පහසුකම්:

9.1 . රෝද පුටු භාවිත හෝ වෙනත් සංචලන ආධාරක උපකරණ භාවිත කරන ඡන්දහිමියන්ට, ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රධාන පිවිසුමේ සිට ඡන්ද පොළ පිහිටි ගොඩනැගිල්ල දක්වා මාර්ගය, භෞතික බාධක (වළවල්, කාණු, බොරලු, ගොඩැලි සහිත රළු භූමියක් හෝ වෙනත් බාහිර බාධක) ඇත්නම් එවා ඉවත් කිරීමත්, ඡන්ද පොළ පිහිටි ගොඩනැගිල්ලට පිවිසුම සඳහා ස්ථිර බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් තිබේ නම් ඒ හරහා ප්‍රවේශ වීමට ඉඩකඩ සලසා දීමත්, බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් නොමැති අවස්ථාවල දී රෝද පුටු භාවිත කරන ඡන්දදායකයින්ට ඡන්ද පොළට පිවිසීම සඳහා අවශ්‍යතාවය අනුව තාවකාලික බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග (Temporary Ramps) සකස් කර ඡන්ද පොළ තුළට පහසුවෙන් පිවිසීම සඳහා ඡන්ද පොළ රාජකාරි නියුතු සියලු නිලධාරීන් විසින් සහාය ලබාදෙනු ලැබේ.

9.2. ඡන්දය සලකුණු කිරීමේ දී රහස්‍යභාවය සහ ස්වාධීනවත්වයට බාධාවක් හෝ බලපෑම් කිරීමක් ඇති නොවන ආකාරයෙන් ඡන්දය සලකුණු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

9.3. ඡන්දය සලකුණු කරන කුටිය තුළට ප්‍රමාණවත් ආලෝකයක් ලැබෙන හෝ විදුලි ආලෝකය සහිත ස්ථානයක ඡන්ද කුටිය ස්ථානගත කිරීම.

9.4. ඡන්ද පෙට්ටිය ස්ථානගත කරනු ලබන මේසය රෝද පුටු භාවිත කරන තැනැත්තන්ට සහ මිහිමිත් තැනැත්තන්ට පහසුවෙන් ළඟා විය හැකිවන සේ සහ ඡන්ද පත්‍රිකාව බහාලීමට හැකිවන සේ උස අඩු මට්ටමකින් ඡන්ද පෙට්ටිය ස්ථාන ගත කිරීම.

9.5. අර්ධ දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අකුරු විශාලනය කර පෙන්වීමේ උපකරණ (අත්කාච, විශේෂ උපැස් යුවල් වැනි පෞද්ගලිකව භාවිත කරන දෑ) ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන ආ හැකි බවත්, එම උපකරණ භාවිත කරමින් ඔවුන්හට ඡන්ද පත්‍රිකාව කියවා ගැනීම හා ඡන්දය නිවැරදිව සලකුණු කිරීමට ඉඩකඩ සලසා දීම.

9.6. ඡන්ද පත්‍රිකාව කියවා ගත නොහැකි තැනැත්තන් සහ පැහැදිලි කර දීමක් අවශ්‍ය යැයි ඉල්ලා සිටින යම් ඡන්දහිමියෙකුට ඔහුට/ඇයට සෙමින් පැහැදිලි කිරීම සහ ඡන්දය සලකුණු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීම.

10. ඒ අනුව ආබාධ සහිත ඡන්දහිමියන් ඡන්දය සලකුණු කිරීමේ දී මුහුණපාන අපහසුතාවන් හා බාධක අවම කිරීම වෙනුවෙන් මැතිවරණ රාජකාරිවල නියුතු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඇතුළු ඡන්ද පොළ රාජකාරිවල නියුතු සියලුම නිලධරයන් මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් හා විධාන නිසි පරිදි අනුගමනය කරනු ඇති බව මෙයින් නිවේදනය කරමි.

ආබාධ සහිත පුරවැසියන් අන් අය හා සමාන හා සාධාරණ පදනමකින් මැතිවරණ ක්‍රියාවලිය තුළට අන්තර්කරණය කර ගැනීම හා ඔවුන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් නිරතුරුව කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්